ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

මානවශාස්ත්‍ර හා සමාජීයවිද්‍යා පීඨය

ශාස්ත්‍රවේදී උපාධි සිව්වන වසර ප්‍රථම අර්ධ වාර්ෂික පරීක්ෂණය –2017 ජූලි/අගෝස්තු

ආර්ථික විද්‍යාව

**ECON 4175.03 – ගෝලීය ආර්ථික විවාද**

කාලය : පැය තුනයි (03)

---

ඕනෑම ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

---

1. (i) වර්තමාන ලෝකයේ පවතින ගැටළු පිළිබඳ තොරතුරු ලබා ගත හැකි මූලාශ්‍ර හතක් (07) නම් කරන්න. (ලකුණු 04 යි)

   (ii) වර්තමාන ලෝකයේ ආර්ථික ගැටළු දහයක් (10) සඳහන් කර එම එක් එක් ගැටළුව කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

   (iii) දේශගුණික වෙනස්වීම් නිසා ඇතිවන ප්‍රතිවිපාක කළමනාකරණය කළ හැකි ආකාර මොනවාදැයි පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

2. (i) ආහාර අනාරක්ෂිතබව නිසා ඇතිවන අහිතකර ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 08 යි)

   (ii) කුටුම්බ ආහාර සුරක්ෂිතතාව සම්බන්ධයෙන් කාන්තාවන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

3. (i) ජෛව විවිධත්වය යනු කුමක්ද? (ලකුණු 02 යි)

   (ii) ජෛව විවිධත්වය නැති ව යාමේ ආර්ථික ප්‍රතිවිපාක මොනවාද? (ලකුණු 04 යි)

   (iii) ජෛව විවිධත්වය ආරක්ෂා කර ගැනීම සඳහා ඔබට කළ හැකි යෝජනා දක්වන්න. (ලකුණු 06 යි)

   (iv) පරිසර පද්ධති ආශ්‍රිත සේවාවන් මනුෂ්‍ය වර්ගයාට උපකාරී වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

4. (i) 'සංස්කෘතික ගෝලීයකරණය' සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

(ii) කලාපීය ආර්ථික සහයෝගීතාවකින් ඇතිවන වාසි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA) ක්‍රියාත්මක කළහොත් කුමන අන්දමේ යහපත්, අයහපත් ප්‍රතිඵල ඇතිවිය හැකි දැයි ඔබට පුරෝකතනය කළ හැකිද? (ලකුණු 04 යි)

5. (i) වර්තමාන ලෝක ජනගහනය මුහුණ දෙමින් සිටින අවදානම් වර්ග මොනවාද? (ලකුණු 05 යි)

(ii) අවදානම වාසිදායක අවස්ථාවක් කරගත හැකි ආකාරය උදාහරණයක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iii) අවදානම කළමනාකරණය කළ හැකි ආකාර පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

6. අප්‍රිකානු උප සහරා කලාපයේ වර්තමාන දිළිඳු බව, දිළිඳු බවේ දුෂ්ඨ චක්‍රය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 16 යි)

7. කෙටි සටහන් ලියන්න.

(i) ගෝලීයකරණයේ නියමුවන් (ලකුණු 04 යි)

(ii) නාගරික නිවාස හිඟය (ලකුණු 06 යි)

(iii) වයස්ගත ජනගහනයට උපකාර කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග (ලකුණු 06 යි)

*************